## දේව ප්‍රකාශන

චතාරික සමය තුන්වන ඉරුදින 11-03-12

පළමුවන කියැවීම නික්මයාම 20:1-17

නික්මයාමපොතෙන් ගත් පාඨයකි.

මෝසෙස් තුමන් මගින් දෙන ලද දස පණත. **(වරහන් තුළ කොටස් අත්හළ හැකිය.)**

දෙවියන් වහන්සේ කතා කොට මේ සියලු ආඥා වදාළ සේක. "වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මම ය. මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය. ("නුඹ සඳහා නෙළූ රූපයක් හෝ ඉහළ අහසෙහි වත් පහළ පොළොවෙහි වත් පොළොවෙන් යට ජලයෙහි වත් ඇති කිසිම වස්තුවකට සමාන දෙයක් හෝ සාදා නොගන්න. නුඹ ඒවාට නමස්කාර නොකරන්න. ඒවාට නොවඳින්න. මන්ද, නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ වන මා ප්‍රතිවාදීන් නොඉවසන දෙවි කෙනෙකු වන බැවිනි. මට වෛර කරන පියවරුන්ගේ පාපය නිසා තුන්වන, සතරවන පරම්පරාව දක්වා දඬුවම් කරමි. එහෙත් මට ප්‍රේම කරමින්, මාගේ ආඥා පිළිපදින දහස් ගණන් අයට මම කරුණාව දක්වමි.") නුඹ දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිතා නොකරව. යමෙක් ඒ නාමය අගරු ලෙස භාවිතා කරන්නේ ද ඔහුට මම දඬුවම් කරමි. සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න. (දවස් හයක් තුළ නුඹ වෙහෙස වී නුඹේ සියලු වැඩ කළ යුතු ය. එහෙත් හත් වන දවස නුඹේ දෙවි සමිඳාණන් වහන්සේට කැප වූ සබතය. එදින නුඹ වත්, නුඹේ පුතු වත්, දුව වත්, නුඹේ සේවකයා වත්, සේවිකාව වත්, නුඹේ සතෙකු වත්, නුඹේ වාසල් දොරටු සීමා ඇතුළ සිටින අමුත්තෙකු වත් කිසි වැඩක් නොකළ යුතු ය. මන්ද සමිඳාණන් වහන්සේ වන මම දින හයක් තුළ අහස හා පොළොව ද, සමුද්‍රය ද, ඒවායේ ඇති සියල්ල ද, සාදා සත්වන දවස නිවාඩු ගත්තෙමි. එබැවින් උන් වහන්සේ සබත් දවසට ආශිර්වාද කොට එය විශුද්ධ කළ සේක.) නුඹේ පියාට ද මවට ද ගෞරව කරව, එවිට නුඹ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහි ය. මිනී නොමරව, කාමමිථ්‍යාචාරය නොකරව, සොරකම් නොකරව. නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකියව. නුඹේ අසල්වැසියාගේ ගෘහයට නුඹ ඇළුම් නොකරව. තවද නුඹේ අසල්වැසියාගේ භාර්යාවට හෝ ඔහුගේ සේවකයාට හෝ සේවිකාවට හෝ ඔහුගේ ගවයාට හෝ කොටළුවාට හෝ නුඹේ අසල්වැසියා සතු වෙනත් කිසිවකට හෝ ඇළුම් නොකරව." දේව වාක්‍යය එසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 19:7-10

පිළිතුර: සමිඳුනි, සදතන ජීවිතයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය.

ගීය: සමිඳුන්ගේ ව්‍යවස්ථාව පරිසමාප්ත ය. ජීවිතය පණ ගන්වන්නේය. සමිඳුන්ගේ නීතිය සත්‍යවාදී ය. අනුවණයන්ට නුවණ දෙන්නේය.

සමිඳුන්ගේ අණ පණත් සාධාරණ ය. සිතට සතුට වඩන්නේ ය. සමිඳුන්ගේ අණසක පැහැදිලි ය. දෙනෙතට එළිය දෙන්නේය.

සමිඳුන් කෙරෙහි ගරු බිය නිර්මල ය. එය සදහට ම පවතින්නේ ය.
සමිඳුන්ගේ විනිශ්චය යුක්ති සහගත ය. මුළුමනින් ම දැහැමි වේ ම ය.

රනට වඩා පෙරූ රනට වඩා එය මනහර ය. පැණියට වඩා මී පැණියට වඩා එය සුමිහිරි ය.

## දෙවන කියැවීම

1 කොරින්ති 1:22-25

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

"අපි කුරුසියේ ඇණගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනා කරමු."

ජුදෙව්වරු හාස්කම් ඉල්ලති. ග්‍රීක්වරු ප්‍රඥව සොයති. එහෙත් අපි, කුරුසියේ ඇණ ගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනා කරමු. මෙය ජුදෙව්වරුන්ට පැකිළීමකි. විජාතීන්ට ප්‍රලාපයකි. එහෙත් කැඳවීම ලත් ජුදෙව්වරුන්ටත්, ග්‍රීක්වරුන්ටත් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ බලය හා ප්‍රඥව වේ. ප්‍රලාපයකැ යි කියන දෙවියන් වහන්සේගේ ප්‍රලාපය මිනිස් ප්‍රඥව ඉක්ම වූ ප්‍රඥවකි. දුබලකමකැයි කියන දෙවියන් වහන්සේගේ දුබලකම මිනිස් ශක්තිය ඉක්ම වූ ශක්තියකි.දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 11:25-26

"පුනරුජ්ජීවනය ද ජීවනය ද මම වෙමි. මා අදහන්නා කිසි කලෙක නොමැරෙන්නේය"යි ජේසුස් ස්වාමින් වහන්සේ වදාරණ සේක.

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 2:13-25

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

"මේ දේව මාළිගය කඩා තෙදිනකින් එය මම ගොඩනගන්නෙමි."

ජුදෙව්වරුන්ගේ පාස්කු මංගල්‍යය ආසන්න ව තිබුන බැවින්, ජේසුස් වහන්සේ ජෙරුසලමට වැඩම කළ සේක. එවිට දේව මාළිගාවේ ගව, බැටළු, පරෙවි වෙළෙන්දන් ද මුදල් මාරු කරන්නන්ද ගනුදෙනුවෙහි යෙදී හිඳිනු උන්වහන්සේ දුක ලණුවලින් කසයක් සාදා ගෙන ගවයන් හා බැටළුවන් හා සියල්ලන් දේව මාළිගාවෙන් පිටතට පලවා හැර මුදල් මාරු කරන්නන්ගේ කාසි විසුරුවා ඔවුන්ගේ මේස පෙරළා දැමූ සේක. ඉන්පසු උන්වහන්සේ පරෙවි වෙළෙඳුන් අමතා, "මේවා අහකට ගෙන යන්න.මාගේ පියාණන්ගේ ගෘහය වෙළඳ පොලක් නොකරන්නැ" යි වදාළ සේක. "ඔබගේ ගෘහයට ඇති උද්‍යෝගයෙන් මම දැවෙමි" යි ලියා තිබෙන බව එවිට ශ්‍රාවකයන්ට මතක් විය. එකල ජුදෙව්වරු, "ඔබ මේ දේවල් කරන බැවින් කුමන ලකුණක් අපට දක්වන්නෙහිද" යි ඇසූහ. ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "මේ දේව මාළිගාව කඩා දමන්න. තෙදිනකින් එය මම ගොඩනගන්නෙමි" යි වදාළ සේක. එවිට ජුදෙව්වරු කතා කොට, "මේ දේව මාළිගාව ගොඩනගන්නට හතළිස් හය වසක් ගත විය. ඔබ එය තෙදිනකින් ගොඩනගන්නෙහි දැ"යි ඇසූහ. එහෙත්, උන්වහන්සේ කතා කෙළේ, තමන්ගේ ශරීරය නැමැති දේව මාළිගාව ගැනය. උන්වහන්සේ මරණින් නැගිටුවනු ලැබූ පසු, ශ්‍රාවකයෝ, උන්වහන්සේ මේ දේ කී බව සිහි කොට ශුද්ධ ලියවිල්ල ද උන්වහන්සේගේ වචනය ද විශ්වාස කළහ. උන්වහන්සේ පාස්කු මංගල්‍යයේ දී ජෙරුසෙලමෙහි සිටි කල්හි, බොහෝ දෙනෙක් උන්වහන්සේ කළ හාස්කම් දැක, උන්වහන්සේ අදහා ගත්හ. එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන් කෙරෙහි විශ්වාසය නොතැබූ සේක. මන්ද, උන්වහන්සේ සියල්ල දත් නිසාය. මිනිස් සිතෙහි ඇති දෙය උන්වහන්සේ දැන සිටි බැවින්, මනුෂ්‍යයා ගැන කිසිවෙකුගේ සාක්ෂියක් උන්වහන්සේට අවශ්‍ය නොවීය.

සුවිශේෂ වාක්‍යය එසේ ය.